# යුග පුරුෂයා මහින්ද නෙවෙයි, විමල් වීරවංශ

හුඟක් ජාතිවාදීන් කියන්නේ අපි කොටි සංවිධානයෙන් මුදල් අරන් මේ විදියට දෙමළ විමුක්තිය ගැන කියනව කියල. ඇත්තටම ඔය ඉහළ නායකයෝ එහෙම හිතනවා වෙන්න බෑ. මොකද? ඒ අය අපේ මතවාදය ගැන දන්න නිසා.

නලින් සිල්වා වගේ අය අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙක් හැටියට හිටපු නිසා එදා අපේ මතයේ ඉඳලා බොහොම හොඳට කරුණු දක්වපු කෙනෙක්. ඒ නිසා කොටි සංවිධානයේ උවමනාවට අපි කථා කරනවා කියන්න ඔහුට බෑ.

ඇත්තටම 1974 අපි දෙමළ ජනතාවගේ අයිතිය ගැන කථා කරන්නට අදහස ඉදිරිපත් කරපු කාලේ කොටි සංවිධානය මේ හිටපු විදියට සංවිධානය වෙලා හිටියේ නෑ. ඔවුන්ගේ මතවාදය හරියට හඳුනාගෙන තිබුනෙත් නෑ.

ඒ නිසා කොටි සංවිධානයේ මුදල්වලට අපි වැඩ කරනවා කියන එක ලොකුම විහිළුවක්. කොටි සංවිධානය මෙන්ම වෙනත් දෙමළ ඊළාම් සංවිධාන ඇත්තටම දෙමළ ස්වපාලනය ගැන හිතනව නම් ඇමරිකාව ඇතුළු බලවතුන් පස්සේ යන්නේ නැතිව දකුණේ වාමාංශිකයන් සමඟ එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ.

හැබැයි කොටි සංවිධානය නොකළේම ඒ විදියට වම තහවුරු වීමට සහය දීමයි. දකුණේ ජනතාවගේ අදහස් දියුණු කිරීමට මෙන්ම ඒ අය පෙළගස්වන්නට ඒ තරම් ඔවුන්ට ඕනෑ වුනේ නෑ.

ඒ කොටි සංවිධානය ධනේශ්වර පෙරළියක් බලාපොරොත්තු වුණ නිසා. වම සමඟ ගමන් කරල පෙරළියක් කිරීම යන අදහස ඔවුන්ට ලොකු කරදරකාරී අදහසක් වුණා. ඔවුන් කල්පනා කළේ වමට වඩා ජාතිවාදීන් බලයට ආවොත් වෙනම රාජ්‍යයක් හදා ගැනීම වඩා පහසු වේවි යන මට්ටමෙන් කියලයි සමහරු කියන්නේ.

ඒක ඇත්තක් නූනත් වම ශක්තිමත් කිරීමට නම් ඔවුන් වෙහෙසුනේ නෑ. ඒ නිසාම වාමාංශිකයන්ව ගොඩනැගීමට උදව් උපකාර කළේත් නෑ.

දකුණේ සිංහල ජනතාව අතර බලය බෙදීම, නැත්නම් දෙමළ අයට ස්වපාලනය ලබාදීම ගැන අපි අදහස් පැතිරුවේ හුඟක් අමාරුවෙන්. දකුණේ ධනපතියන් ඒ අදහසට කොහොමටවත් එකඟ වුනේ නෑ.

කොම්ප්‍රදෝරු ධනපතියන්, ඒ කියන්නේ ලොකු ධනපති සමාජය සාමාන්‍යයෙන් ජාතිවාදයට බර නෑ. මොකද? එම පංතියත් විවිධ පසුබිම්වලින් ඇවිත් මහ ධනපති පංතියට ඇතුල් වුණ අය නිසා.

ඒ වුණත් ඒ අය කොහොමටත් වමට විරුද්ධයි. මේ ජාතික ප්‍රශ්නය උඩ යම් සුහද බවක් පෙන්නුවත් සම සමාජය කියන්නේ තමන්ගේ විරුද්ධවාදීන් කියල ඒ අය හොඳට දන්නවා. ඒ අනුව මේ ධනපති කොටස්වලින් සම සමාජයට උදව් ලබා ගන්න බැහැ, අහම්බෙන් කෙනෙක් අපේ දර්ශනයට ඇදිල ඇවිත් හවුල් වුණොත් මිසක්.

ඒ නිසා අපිට බලාපොරොත්තු වෙන්න පුළුවන් දෙමළ ධනපතියන්ගෙන් පමණයි යම් යුක්තියක් කරයි කියල. ඇත්තටම දෙමළ ජාතික ප්‍රශ්නයට සිංහල සහයත් ලබාගන්න නම් වම ශක්තිමත් කරන්නම ඕනෑ.

ඒත් ඒ විදියට කොටි සංවිධානය සම්පත් යොමු කළේ නෑ. ඒ අය කල්පනා කළේ තමන්ගේ යුද්ධමය ක්‍රියාමාර්ග ගැන පමණයි. සිංහල වමට ආධාර කළොත් තමන්ගේ ගමනට වමෙන් අභියෝගයක් වෙයි කියල හිතුවද කියල එක එල්ලේ කියන්න බෑ.

ඇත්තටම එහෙම වෙන්න පුළුවන්. තවමත් ඩයස්පෝරා එකෙන් මුදල් වියදම් කරන්නේ විවිධ ධනපති පාලකයන් තමන්ගේ ප්‍රශ්නයට හිතවත් කරගැනීම උදෙසායි. වැඩ කරන ජනතා බලය උඩ මෙවැනි ප්‍රජාතන්ත්‍රවාදී නිදහසේ සටනකට උදව් ලබාගන්න පුළුවන් කියල ලොකුවට ඒ අය කල්පනා කරන්නේ නෑ.

ඇත්තටම ඔය කියන විදියට අපට මුදල් ලැබෙනවා නම් රැස්වීම්, පෙළපාලි ආදී වශයෙන් වැඩකටයුතු කොපමණ කරන්න පුළුවන්ද? පුවත්පත් සාකච්ඡා වුණත් තියන්න කොච්චර මුදල් යනවාද?

අද දේශපාලනයේදී මුදල් ලොකු ප්‍රශ්නයක්. කථා කිරීමේ නිදහස තිබුණට ඒක ක්‍රියාත්මක කරන්න ලැබෙන්නේ මුදල් තියෙන ප්‍රමාණයට. මේ නිසා අද ජාතිවාදය උඩට ඇවිත් තියෙන්නේ ඒකට තියෙන සම්පත් ප්‍රමාණය අනුව මිසක් ඇති යථාවාදී වටිනාකම් උඩ නෙවෙයි.

අද වෙනකොට තවත් පැහැදිලියි ආණ්ඩුවේ ජාතිවාදී වැඩපිළිවෙල උඩ ප්‍රශ්න විසඳුනේ නැති බව. ඒ වෙනුවට මුළු රටම විදේශික බලවේගවලට යට වෙලා. මේ සංවර්ධනය කියන්නේ වෙන රටවල සමාගම් වෙනුවෙන් සංවර්ධනයක්. නැතිව මේ රටේ කම්කරුවට, ගොවියට, ධීවරයට ලැබෙන සංවර්ධනයක් නෙවෙයි.

දන් බෝම්බ පිපිරෙන්නේ නැති බව ඇත්ත. ඒ වුනත් අපේ ප්‍රශ්නය පිට රටුන් විසඳන්න මැදිහත් වීමෙන් වෙන ගැටුම් මතු වෙන එක නවත්වන්න බෑ. ආණ්ඩුව ඇමරිකාව, ඉංන්දියාව කියන විදියට පෙඩරල් විසඳුම් දෙන්න ගියොත් මැරුණ අය වෙනුවෙන් උත්තර බඳින්න වේවි.

ආණ්ඩුව තුළින්ම විවිධ කුමන්ත්‍රණ ඇති වේවි. දන් තිබෙන ජීවන බර ප්‍රශ්නයත්, අධ්‍යාපන ප්‍රශ්නත්, සෞඛ්‍ය ප්‍රශ්නත් තුළ ආණ්ඩුව බෙදිල වැඩ කරන විට මොන විදියේ පාලනයක් බවට එය පත් වෙයිද?

හැබැයි ජනාධිපතිතුමා කියපු එක දෙයක් ඇත්ත. විපක්ෂයේම සමහරු එයා හමු වෙලා මුක්කු ගහන එක. මේ තමා ආණ්ඩුවට තියෙන ලොකුම ශක්තිය. විපක්ෂය තුළ ඇති බෙදීම් නවත්වන්නට නම් ලේසි නෑ. මොකද, මොන දේ කළත් ජනතා විමුක්ති පෙරමුණටත්, එක්සත් ජාතික පක්ෂයටත් එකතුවෙලා සන්ධානයක් හදන්න බෑ.

මහින්ද සමඟ ජනතා විමුක්ති පෙරමුණ සන්ධානගත වුණේ ජාතිවාදය උඩ. සිංහල ජාතිවාදය උඩ මේ දෙගොල්ලෝ කිරියි පැණියි වගේ එකතු වුණා. ඒත් මහින්ද ගමන් කරන ගෝලීය ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියට ජනතා විමුක්ති පෙරමුණට එකඟ වෙන්න බැරි වුණා.

අපරාදේ කියන්න බෑ, විමල් වීරවංශ කණ්ඩායම නම් ආත්මය විකුණාගෙන මහින්දට එකතු වුණා. උන්නැහේලා ඒ ගමන්මගේ හුඟක් දුර ගිහින්. ඒ අනුව ඒ බලවේගය තුළ ලොකු නායකයෙක් ජනතාවට පෙනෙන්න බොරු සෝබන දමමින් මේ රටේ ඉඩම්, සම්පත් මහ කොම්පැණිවලට පවරා දීම ගජරාමෙට කරගෙන යනවා.

ඒ ගමනට ආශීර්වාදකම් කරන්නේ විමල් වීරවංශ. ලෝක බැංකුව දෙන උපදෙස් අනුව දේශීය මුහුණුවර රටට පෙන්වලා ගේම් එක හරියට කරන කෙනෙක් විමල් වීරවංශ. ජනතාවට බහිරවයා විණ කරන මේ යුගයේ යුග පුරුෂයා මහින්ද නෙවෙයි, විමල් වීරවංශ. විමල් මල්ලි උඹට තුනුරුවන්ගේම පිහිටයි.